දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
**No. 177, Nawala Road, Narahenpita, Colombo 05.**


මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/03-01-13/14/2013

ඔබේ අංකය / உமது இல. / Your No.: TA/SA/01/2013

දිනය / திகதி / Date: 2017.05. 16

ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

<u>වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ සහ අතුරු වෛද්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ එම්ටී - 08 තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර ගැනීම.</u>

උක්ත කරුණ හා සම්බන්ධ ඔබේ සමාංක හා 2017.04.20 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පරිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ආර්.ඩී.පී.එස්. ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් -

01. ලේකම් - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - (මුල් පිටපත මේ සමඟ එවමි.)
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - (මුල් පිටපත මේ සමඟ එවමි.)

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
**No. 177, Nawala Road, Narahenpita, Colombo 05.**

PSC/EST/03-01-13/14/2013
මගේ අංකය / எனது இல. / My No. TA/SA/01/2013
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2017.05. 16

ලේකම්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

**<u>වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ සහ අතුරු වෛද්‍ය සේවයේ විශේෂ ශ්‍රේණියේ එම්ටී - 08 තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර ගැනීම.</u>**

උක්ත කරුණ හා සම්බන්ධ ඔබේ සමාංක හා 2017.04.20 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පරිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

ආර්.ඩී.පී.එස්. ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් -
01. ලේකම් - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - (මුල් පිටපත මේ සමඟ එවමි.)
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - (මුල් පිටපත මේ සමඟ එවමි.)

**සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවා ගණයේ MT – 08 සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව: අදාල නොවේ.

1.2 අමාත්‍යාංශය: සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
යොමු අංකය:TA/SA/01/2013 දිනය: 2015.10.20

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම:
යොමු අංකය: DMS/0054 දිනය:2013.12.03
DMS/0054/PPSM දිනය:2014.04.01

1.4. ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය:Est-3/RECRU/04/6642 දිනය :2012.08.29

1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය:
යොමු අංකය : NSCC/4/13/SR/21 දිනය : 2017.03.08

1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:
යොමු අංකය: PSC/EST/3/1/13/14/2013 දිනය : 2016.02.26

**02.** පත් කිරීම් බලධරයා :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාව

3.2. ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවට අයත් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, ඖෂධවේදී, විකිරණ ශිල්පී, භෞත චිකිත්සක හා වෘත්තීය චිකිත්සක යන තනතුරුවලට අයත් සියළුම ශ්‍රේණිවල නිලධාරීන්ගේ කාර්යයන් අධීක්ෂණය, කළමනාකරණය, කාර්ය සාධන ඇගයීම, විනය පාලනය, පුහුණුව ලබාදීම හා රාජකාරි පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම මඟින් එක් එක් තනතුරට අදාල කාර්යයන් උපරිම කාර්යක්ෂමතාවයකින් ලබාදීම තහවුරු කිරීම

3.4. කාර්යයන් පැවරීම : " තනතුර පදනම්ව කාර්යයන් පැවරීමක් සිදු කරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම අධීක්ෂණ කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක."

**04.** තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
සටහන - විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.

**05.** වැටුප්

5.1. සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය : MT – 8 – 2016

5.2. වැටුප් පරිමාණය : රු. 50,200 - 10 × 1345 - 08 × 1630 - 76,690

5.3. සේවා ගණයට අදාළ ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය රු. |
|---|---|---|
| විශේෂ | පියවර 03 | රු. 52,890/= |

**06.** සේවා ගණයට අයත් තනතුරු

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් : ඇමුණුම-01

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

- ❖ විශේෂ ශ්‍රේණියේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ -31
- ❖ විදුහල්පති වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ විදුහල -03
- ❖ ජ්‍යෙෂ්ඨ ආචාර්ය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ -03
- ❖ විශේෂ ශ්‍රේණියේ ඖෂධවේදී -31
- ❖ විදුහල්පති - ඖෂධවේදී පාසල -01
- ❖ ප්‍රාදේශීය ඖෂධවේදී -01
- ❖ සම්බන්ධීකාරක - ඖෂධවේදී පුහුණු පාසල -01
- ❖ ජ්‍යෙෂ්ඨ ආචාර්ය ඖෂධවේදී -02
- ❖ විශේෂ ශ්‍රේණියේ විකිරණ ශිල්පී -23
- ❖ විදුහල්පති - විකිරණ ශිල්පී පාසල -01
- ❖ ජ්‍යෙෂ්ඨ ආචාර්ය විකිරණ ශිල්පී පාසැල -01
- ❖ විශේෂ ශ්‍රේණියේ භෞත චිකිත්සක -14
- ❖ විශේෂ ශ්‍රේණියේ වෘත්තීය චිකිත්සක -05
- ❖ විදුහල්පති - භෞත චිකිත්සක සහ වෘත්තීය චිකිත්සක පාසල -01
- ❖ ජ්‍යෙෂ්ඨ ආචාර්ය භෞත චිකිත්සක -01
- ❖ ජ්‍යෙෂ්ඨ ආචාර්ය වෘත්තීය චිකිත්සක -01

**07.** බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | - |
| කුසලතා | 100% |

7.2. විවෘත බඳවා ගැනීම : අදාල නොවේ

7.3. සීමිත බඳවා ගැනීම : අදාල නොවේ

7.4. කුසලතා බඳවා ගැනීම

7.4.1. බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය

සටහන : විශේෂ ශ්‍රේණියේ විදුහල්පති සහ සම්බන්ධීකාරක තනතුර සඳහා මෙහි 11 වගන්තියේ සඳහන් පරිදි විශේෂ ශ්‍රේණියේ අදාල ජ්‍යෙෂ්ඨ ආචාර්ය තනතුරු දරණ නිලධාරීන්ගෙන් පත් කරනු ලබන අතර විශේෂ ශ්‍රේණියේ අනෙකුත් තනතුරු සඳහා මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි 7 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

මෙම ජ්‍යෙෂ්ඨ ආචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීමේදී එක් ක්‍රමවේදයක් ද අනෙකුත් තනතුරු සඳහා බඳවා ගැනීමේදී තවත් ක්‍රමවේදයක් ද අනුගමනය කරනු ලැබේ.

7.4.2. සුදුසුකම් :

7.4.2.1. අධ්‍යාපන සුදුසුකම් : අදාල නොවේ

7.4.2.2. වෘත්තීය සුදුසුකම් :

ජාතික සෞඛ්‍ය විද්‍යාතනය විසින් පවත්වනු ලබන ඉගැන්වීම් පිළිබඳ මාස 06ක පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කර තිබීම හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මාස 06කට නොඅඩු ඉගැන්වීම් පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම.

(ජ්‍යෙෂ්ඨ ආචාර්ය තනතුර සඳහා පමණක් අදාල වන අතර අනෙකුත් තනතුරු සඳහා වෘත්තීය සුදුසුකම් අදාල නොවේ.)

7.4.2.3. පළපුරුද්ද :

අදාල තනතුරෙහි අධි ශ්‍රේණියේ / I වන ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හෝ වසර පහ (05) ක සේවා කාලයක් සහිත අධි ශ්‍රේණියේ සිටින නිලධාරියෙකු වීම.

| තනතුර | අදාල විශේෂ ශ්‍රේණියේ තනතුර |
|---|---|
| වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | විශේෂ ශ්‍රේණියේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ |
| ඖෂධවේදී | විශේෂ ශ්‍රේණියේ ඖෂධවේදී / ප්‍රාදේශීය ඖෂධවේදී |
| විකිරණ ශිල්පී | විශේෂ ශ්‍රේණියේ විකිරණ ශිල්පී |
| භෞත චිකිත්සක | විශේෂ ශ්‍රේණියේ භෞත චිකිත්සක |
| වෘත්තීය චිකිත්සක | විශේෂ ශ්‍රේණියේ වෘත්තීය චිකිත්සක |
| ආචාර්ය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | ජ්‍යෙෂ්ඨ ආචාර්ය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ |
| ආචාර්ය ඖෂධවේදී | ජ්‍යෙෂ්ඨ ආචාර්ය ඖෂධවේදී |
| ආචාර්ය විකිරණ ශිල්පී පාසැල | ජ්‍යෙෂ්ඨ ආචාර්ය විකිරණ ශිල්පී පාසැල |
| ආචාර්ය භෞත චිකිත්සක | ජ්‍යෙෂ්ඨ ආචාර්ය භෞත චිකිත්සක |
| ආචාර්ය වෘත්තීය චිකිත්සක | ජ්‍යෙෂ්ඨ ආචාර්ය වෘත්තීය චිකිත්සක |

7.4.2.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.4.2.5. වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

IV. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතුය.

V. පළමුවන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වී තිබිය යුතුය.

VI. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියළුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම, අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුය.

7.4.3 වයස : අදාල නොවේ

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය :

(අ) විශේෂ ශ්‍රේණියට / ප්‍රාදේශීය ඖෂධවේදීයට අදාලව

තනතුරුවල පවතින පුරප්පාඩු අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව අයදුම්පත් කැඳවා සුදුසුකම් පරීක්‍ෂා කිරීම සඳහා එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් මගින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්‍ෂණයක් පවත්වා ඉහලම ලකුණු ලැබූවන්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පුරප්පාඩු අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. අධි ශ්‍රේණියේ / I ශ්‍රේණියේ අදාල තනතුරු දරණ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් හෝ පස් (05) දෙනෙකු යන දෙකෙන් වැඩි සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ.

(ආ) ජ්‍යෙෂ්ඨ ආචාර්ය තනතුරට අදාලව

තනතුරුවල පවතින පුරප්පාඩු අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව අයදුම්පත් කැඳවා සුදුසුකම් පරීක්‍ෂා කිරීම සඳහා එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් මගින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්‍ෂණයක් පවත්වා ඉහලම ලකුණු ලැබූවන්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පුරප්පාඩු අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. අධි ශ්‍රේණියේ / I ශ්‍රේණියේ අදාල තනතුරු දරණ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් හෝ පස් (05) දෙනෙකු යන දෙකෙන් වැඩි සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ.

සටහන: ඉහත (අ) සහ (ආ)ට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් උසස් කරනු ලබන නිලධාරීන් සේවා ස්ථාන වෙත අනුයුක්ත කිරීමේදී යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්‍ෂණයේදී ලබාගනු ලැබූ කුසලතා අනුපිළිවෙල අනුව අනුමත සේවක සංඛ්‍යාවේ පවතින පුරප්පාඩු සඳහා ඔවුන්ගේ කැමැත්තේ අනුපිළිවෙලට මනාපය ලකුණු කිරීමට අවස්ථාව ලබාදී බඳවා ගනු ලැබේ.

7.4.4.1 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ

7.4.4.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ

7.4.4.3 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

7.4.4.3.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක්

7.4.4.3.2 ලකුණු දීමේ පරිපාටිය

(අ). විශේෂ ශ්‍රේණියට / ප්‍රාදේශීය ඖෂධවේදීට අදාලව

| ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රය | ලබා දෙනු ලබන ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා සලකා ලබන ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. සේවා පලපුරුද්ද | 60 | අදාල නොවේ |
| 02.අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | |
| 03. විශේෂ කුසලතාවයන් | 10 | |
| එකතුව | 100 | |

(ආ). ජ්‍යෙෂ්ඨ ආචාර්ය තනතුරට අදාලව

| ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍රය | ලබා දෙනු ලබන ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා සලකා ලබන ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. සේවා පලපුරුද්ද | 60 | අදාල නොවේ |
| 02. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | |
| 03. විශේෂ කුසලතාවයන් | 10 | |
| එකතුව | 100 | |

ඉහත (අ) සහ (ආ) හි සඳහන් ලකුණු පරිපාටිවලට අදාලව සවිස්තරාත්මකව ලකුණු පරිපාටි අදාල අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුමත කරනු ලබන අවස්ථාවේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබේ.

**08.** කාර්යක්ෂමතා කඩඉම් : අදාල නොවේ

**09.** භාෂා ප්‍රවීණතාව : අදාල නොවේ

**10.** ශ්‍රේණි උසස් කිරීම් : අදාල නොවේ

**11.** තනතුරුවලට පත් කිරීම :

<table>
<tr><th>තනතුර</th><th>සුදුසුකම්</th><th>තෝරා ගනු ලබන ආකාරය</th></tr>
<tr><td>01. විදුහල්පති</td><td>අදාල ජ්‍යෙෂ්ඨ ආචාර්ය තනතුරේ වසර 03 ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br>හා<br>උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම .
<table>
<tr><th>තනතුර</th><th>අදාල විදුහල්පති තනතුර</th></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ ආචාර්ය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ</td><td>විදුහල්පති වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ විදුහල</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ ආචාර්ය ඖෂධවේදී</td><td>විදුහල්පති - ඖෂධවේදී පාසල</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ ආචාර්ය විකිරණ ශිල්පී පාසැල</td><td>විදුහල්පති - විකිරණ ශිල්පී පාසැල</td></tr>
</table></td><td>අභ්‍යන්තර චක්‍ර ලේඛ මඟින් / රජයේ ගැසට් පත්‍රයේ / ප්‍රසිද්ධ දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවා සුදුසුකම්ලත් අයදුම්කරුවන් පහත සඳහන් ලකුණු දීමේ ක්‍රමය පදනම් කර ගනිමින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගැනේ.<br><br>(1) සේවා පළපුරුද්ද - 60<br>(2) අතිරේක අධ්‍යාපන සුදුසුකම් -30<br>(3) විශේෂ කුසලතාවයන් -10</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | ජ්‍යෙෂ්ඨ ආචාර්ය භෞත චිකිත්සක | විදුහල්පති - භෞත චිකිත්සක හා වෘත්තීය චිකිත්සක පාසල | අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුමත කරනු ලබන අවස්ථාවේදී සවිස්තරාත්මක ලකුණු පරිපාටිය ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබේ. |
| | ජ්‍යෙෂ්ඨ ආචාර්ය වෘත්තීය චිකිත්සක | | |
| 02. සම්බන්ධීකාරක -ඖෂධවේදී පාසල | ඖෂධවේදී ජ්‍යෙෂ්ඨ ආචාර්ය තනතුරේ වසර 03 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br>හා<br>උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම | | |

**12.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : අදාල නොවේ

**13.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයක් ඇතුලත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුලත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

**14.** ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතුවූවන් සඳහා

මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබාදී ඇති MT-08 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කරගෙන ය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවැති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතු ය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාල තැනැත්තා අවසන්වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

14. 1 (අ) නියමිත දින වනවිට සේවයේ නියුතු වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, ඖෂධවේදී, විකිරණ ශිල්පී, භෞත චිකිත්සක, සහ වෘත්තීය චිකිත්සක විශේෂ ශ්‍රේණියට අයත් නිලධාරීන් ප්‍රතිසංවිධිත වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සිදු කරනු ලැබේ.

(ආ) සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරුවල සිටින නිලධාරීන් විශේෂ ශ්‍රේණියේ තනතුරුවල අන්තර්ග්‍රහනය හේතුකොටගෙන නියමිත දිනදී අදාල පන්තිවල/ශ්‍රේණිවල ඒ ඒ නිලධාරීන්ට හිමිව පැවති ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට හානියක් සිදු නොවනු ඇත.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සලසා නොමැති කරුණක් පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

17. අන්තර් කාලීන විධි විධාන

මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වන දින සිට ඉදිරියට වසර 03ක් දක්වා අන්තර්කාලීන විධි විධාන ක්‍රියාත්මක වන අතර එම කාලය තුල විශේෂ ශ්‍රේණියට/ විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක P/28/32/05/2009 හා 2009.04.16 දිනැති ලිපියෙන් අනුමත කර ඇති පහත සඳහන් ක්‍රමවේදයට අනුව සිදු කරනු ඇත.

ලකුණු ලබාදීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨත්වය | - | ලකුණු 60 |

මූලික සුදුසුකම ඉක්මවූ අධි ශ්‍රේණියේ / I වන ශ්‍රේණියේ සෑම එක් වසරක සේවා කාලයක් සඳහා ලකුණු 05 බැගින් හිමි වේ.

| | | |
|---|---|---|
| කුසලතා | - | ලකුණු 40 |

ඇගයීම් කරනු ලබන දිනට ආසන්නතම,

| | | |
|---|---|---|
| අඛණ්ඩ වසර 5ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - | ලකුණු 40 |
| වසර 4ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - | ලකුණු 32 |
| වසර 3ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - | ලකුණු 24 |
| වසර 2ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - | ලකුණු 16 |
| වසර 1ක සතුටුදායක සේවා කාලයක් සඳහා | - | ලකුණු 08 |

සකස් කලේ : අත්සන : ...................................... පරීක්ෂා කලේ : අත්සන: ......................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම: ...................................... එන්. ... එන්. හර්ෂනී, ... (...) 02, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

තනතුර : ...................................... "සුවසිරිපාය" 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

දිනය: 2017/04/06

නම: ...................................... එච්. ශ්‍රියාණි ප්‍රනාන්දු, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III, ලේකම් වෙනුවට

තනතුර: ...................................... සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

දිනය: 07/04/2017

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

වෛද්‍ය ජේ. එම්. ඩබ්. ජයසුන්දර බණ්ඩාර
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

අත්සන: ......................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම: ..........................................................

තනතුර: ........................................................

දිනය: 2017/04/17 .......... නිල මුද්‍රාව:

---

යොමු අංකය: **TA/SA/01/2013**

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ හි වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ, ඖෂධවේදී, විකිරණ ශිල්පී, භෞත චිකිත්සක, වෘත්තීය චිකිත්සක විශේෂ ශ්‍රේණියේ තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන: .......................................................

නම: ........................................................

බී. ජී. එස්. ගුණතිලක
අතිරේක ලේකම් (පාලන) I
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

ලේකම්,

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

දිනය: 2017/04/21 .......... නිල මුද්‍රාව:

වැඩ බලන ලේකම්
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

---

යොමු අංකය: PSC/EST/3/1/13/14/2013

සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ තනතුරු ............ සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2016.02.26 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන: .......................................................

නම: .......................................................

ලේකම්. (වැඩබලන ලේකම් )
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ජේ. කුලතුංග
අතිරේක ලේකම් (පාලන හා මුල්‍ය)
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ - 05.

දිනය: 2017.05.12 .......... නිල මුද්‍රාව

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | තනතුර අනුමත ශ්‍රේණිය | කාර්යයන් |
|---|---|---|---|
| විශේෂ ශ්‍රේණියේ වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | 31 | විශේෂ ශ්‍රේණිය | III, II හා I ශ්‍රේණියේ නිලධාරීන්ට අදාල කාර්යයන් අධීක්ෂණය කිරීම, ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම, ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම, ඔවුන්ගේ රාජකාරි පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී සහායවීම, අදාල උපදෙස් හා තොරතුරු ලබාදීම, තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු<br><br>ඉහත කරුණු වලට අමතරව සියළුම ශ්‍රේණිවල නිලධාරීන් පොදු චක්‍රලේඛ අංක 02 - 17/2006 මඟින් පැවරෙන කාර්යයන් වලටද යටත් වේ. |
| විදුහල්පති වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ විදුහල | 03 | විශේෂ ශ්‍රේණිය | ආචාර්ය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ හා ජ්‍යෙෂ්ඨ ආචාර්ය පරිපාලනය, පුහුණු සිසුන් තෝරා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නියෝජනය, ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම, අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය, ශිෂ්‍ය විනය හා ප්‍රධාන අධීක්ෂණය, විෂය සමගාමී අධ්‍යාපනික වැඩ සටහන් මෙහෙයවීම හා පාඨමාලා සම්බන්ධීකරණය, තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| ජ්‍යෙෂ්ඨ ආචාර්ය වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | 03 | විශේෂ ශ්‍රේණිය | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම සඳහා සහයෝගය ලබාදීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම, අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය, ශිෂ්‍ය අධීක්ෂණය, පාඨමාලා සම්බන්ධීකරණය හා අධ්‍යාපනික වැඩ සටහන් සංවිධානය, විදුහල්පති නොමැති අවස්ථාවලදී එම තනතුරෙහි වැඩ ආවරණය කිරීම හා තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| විශේෂ ශ්‍රේණියේ ඖෂධවේදී | 31 | විශේෂ ශ්‍රේණිය | III, II හා I ශ්‍රේණියේ නිලධාරීන්ට අදාල කාර්යයන් අධීක්ෂණය කිරීම, ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම, ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම, ඔවුන්ගේ රාජකාරි පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී සහායවීම, අදාල උපදෙස් හා තොරතුරු ලබාදීම, ඉහත කරුණු වලට අමතරව මෙම ශ්‍රේණියේ නිලධාරීන් පොදු චක්‍රලේඛ අංක 02 - 83/98 මඟින් පැවරෙන කාර්යයන් හා තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| විදුහල්පති - ඖෂධවේදී පාසල | 01 | විශේෂ ශ්‍රේණිය | ඖෂධවේදී ආචාර්ය හා ජ්‍යෙෂ්ඨ ආචාර්ය පරිපාලනය, පුහුණු සිසුන් තෝරා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නියෝජනය, ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම, අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය, ශිෂ්‍ය විනය හා ප්‍රධාන අධීක්ෂණය, විෂය සමගාමී අධ්‍යාපනික වැඩ සටහන් මෙහෙයවීම හා පාඨමාලා සම්බන්ධීකරණය හා තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| සම්බන්ධීකාරක - ඖෂධවේදී පුහුණු පාසල | 01 | විශේෂ ශ්‍රේණිය | |

| | | | |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ ආචාර්ය ඖෂධවේදී | 02 | විශේෂ ශ්‍රේණිය | ඖෂධවේදී ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්න හා ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම සඳහා සහයෝගය ලබාදීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම, අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය, ශිෂ්‍ය අධීක්ෂණය, පාඨමාලා සම්බන්ධීකරණය හා අධ්‍යාපනික වැඩ සටහන් සංවිධානය, විදුහල්පති නොමැති අවස්ථාවලදී එම තනතුරෙහි වැඩ ආවරණය කිරීම හා තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| ප්‍රාදේශීය ඖෂධවේදී | 01 | විශේෂ ශ්‍රේණිය | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය තුළ ඖෂධවේදීන් සම්බන්ධ කටයුතුවලදී සම්බන්ධීකරණය කිරීම හා සහය දීම හා තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| විශේෂ ශ්‍රේණියේ විකිරණ ශිල්පී | 23 | විශේෂ ශ්‍රේණිය | III, II හා I ශ්‍රේණියේ නිලධාරීන්ට අදාල කාර්යයන් අධීක්ෂණය කිරීම, ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම, ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම, ඔවුන්ගේ රාජකාරි පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී සහායවීම, අදාල උපදෙස් හා තොරතුරු ලබාදීම හා තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| විදුහල්පති - විකිරණ ශිල්පී පාසැල | 01 | විශේෂ ශ්‍රේණිය | විකිරණ ශිල්පී ආචාර්ය හා ජ්‍යෙෂ්ඨ ආචාර්ය පරිපාලනය, පුහුණු සිසුන් තෝරා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නියෝජනය, ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්න හා ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම, අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය, ශිෂ්‍ය විනය හා ප්‍රධාන අධීක්ෂණය, විෂය සමගාමී අධ්‍යාපනික වැඩ සටහන් මෙහෙයවීම හා පාඨමාලා සම්බන්ධීකරණය, තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| ජ්‍යෙෂ්ඨ ආචාර්ය විකිරණ ශිල්පී පාසැල | 01 | විශේෂ ශ්‍රේණිය | විකිරණ ශිල්පී ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්න හා ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම සඳහා සහයෝගය ලබාදීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම, අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය, ශිෂ්‍ය අධීක්ෂණය, පාඨමාලා සම්බන්ධීකරණය හා අධ්‍යාපනික වැඩ සටහන් සංවිධානය, විදුහල්පති නොමැති අවස්ථාවලදී එම තනතුරෙහි වැඩ ආවරණය කිරීම, තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| විශේෂ ශ්‍රේණියේ භෞත චිකිත්සක | 14 | විශේෂ ශ්‍රේණිය | III, II හා I ශ්‍රේණියේ නිලධාරීන්ට අදාල කාර්යයන් අධීක්ෂණය කිරීම, ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම, ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම, ඔවුන්ගේ රාජකාරි පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී සහායවීම, අදාල උපදෙස් හා තොරතුරු ලබාදීම හා තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| විශේෂ ශ්‍රේණියේ වෘත්තීය චිකිත්සක | 05 | විශේෂ ශ්‍රේණිය | III, II හා I ශ්‍රේණියේ නිලධාරීන්ට අදාල කාර්යයන් අධීක්ෂණය කිරීම, ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම, ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම, ඔවුන්ගේ රාජකාරි පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී සහායවීම, අදාල උපදෙස් හා තොරතුරු ලබාදීම හා තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු.<br>ඉහත කරුණු වලට අමතරව මෙම ශ්‍රේණියේ නිලධාරීන් පොදු චක්‍රලේඛ අංක 02 - 22/99 මඟින් පැවරෙන කාර්යයන් වලටද යටත් වේ. |
| විදුහල්පති - භෞත චිකිත්සක හා වෘත්තීය චිකිත්සක පාසැල | 01 | විශේෂ ශ්‍රේණිය | භෞත චිකිත්සක හා වෘත්තීය චිකිත්සක ආචාර්ය හා ජ්‍යෙෂ්ඨ ආචාර්ය පරිපාලනය, පුහුණු සිසුන් තෝරා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නියෝජනය, ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම, අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය, ශිෂ්‍ය විනය හා ප්‍රධාන අධීක්ෂණය, විෂය සමගාමී අධ්‍යාපනික වැඩ සටහන් මෙහෙයවීම හා පාඨමාලා සම්බන්ධීකරණය, තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| ජ්‍යෙෂ්ඨ ආචාර්ය භෞත චිකිත්සක | 01 | විශේෂ ශ්‍රේණිය | භෞත චිකිත්සක ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම සඳහා සහයෝගය ලබාදීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම,<br>අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය, ශිෂ්‍ය අධීක්ෂණය, පාඨමාලා සම්බන්ධීකරණය හා අධ්‍යාපනික වැඩ සටහන් සංවිධානය, විදුහල්පති නොමැති අවස්ථාවලදී එම තනතුරෙහි වැඩ ආවරණය කිරීම හා තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |
| ජ්‍යෙෂ්ඨ ආචාර්ය වෘත්තීය චිකිත්සක | 01 | විශේෂ ශ්‍රේණිය | වෘත්තීය චිකිත්සක ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම සඳහා සහයෝගය ලබාදීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම, අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය, ශිෂ්‍ය අධීක්ෂණය, පාඨමාලා සම්බන්ධීකරණය හා අධ්‍යාපනික වැඩ සටහන් සංවිධානය, විදුහල්පති නොමැති අවස්ථාවලදී එම තනතුරෙහි වැඩ ආවරණය කිරීම හා තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු. |

සකස් කළේ :

අත්සන : ……………………

නම : එන්. ජේ. එන්. හර්ෂනී

තනතුර : අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය" 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

දිනය : ……………………

පරීක්ෂා කළේ :

අත්සන : ……………………

නම : එච්. ශ්‍රියාණි ප්‍රනාන්දු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III ලේකම් වෙනුවට

තනතුර : සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

දිනය : 07 ……………………

අත්සන : ……………………

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම: වෛද්‍ය ජේ. එම්. ඩබ්. ජයසුන්දර බණ්ඩාර

තනතුර: සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, 385, "සුවසිරිපාය", පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

දිනය: 17/04/2017

නිල මුද්‍රාව :